# කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය

## දෙවන වාර පරීක්ෂණය - 2017

## බුද්ධ ධර්මය

**11 ශ්‍රේණිය** **I පත්‍රය** **කාලය: පැය 01 යි**

- උපදෙස්:
  - (1) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - (2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (X) ලකුණ යොදන්න.
  - (3) මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ප්‍රමාණය 40 කි.

(01) සිදුහත් බෝසතුන්ගේ රූපශ්‍රීය හා ශාන්ත බව දක ''මෙවන් පුත්‍රයෙකු ලද මවක් පියෙක් නිවුණෝවෙති'' යනාදී වශයෙන් ප්‍රකාශ කරනු ලැබුවේ

(i) භද්දකච්චායනා විසිනි. (ii) රූපනන්දා විසිනි.
(iii) උප්පලවන්නා විසිනි. (iv) කිසාගෝතමී විසිනි.

(02) සිදුහත් බෝසතුන්ට මුහුණ දීමට සිදුවූ අභියෝගයක් නොවන්නේ

(i) තනතුරු බෙදාදීම (ii) පස්කම් සුව අත් හැරීම
(iii) පෙර නිමිති දැකීම (iv) ශිල්ප හැදෑරීම

(03) බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ

(i) උපාසක නාමයෙනි. (ii) උපාසිකා නාමයෙනි.
(iii) භික්ඛු නාමයෙනි. (iv) මේ කිසිවකින් නොවේ.

(04) ගැබිණි මාතාවකට අංගුලිමාල පිරිත දේශනා කර ආශීර්වාද කිරීමේ පටන් දරුවාට නම් තැබීම, ඉඳුල් කට ගෑම, අකුරු කියවීම සිදුකරනු ලබන්නේ

(i) ගම්මුලාදෑනියා විසිනි (ii) දෙමාපියන් විසිනි
(iii) ගමේ පන්සලේ නායක හිමියන් විසිනි (iv) අත්තම්මා විසිනි

(05) බෞද්ධ දරුවෙකු ලෙස ඔබ විහාරස්ථානයට ගිය විට ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන අනුපිළිවෙල ඇතුළත් පිළිතුර වන්නේ

(i) පාරිභෝගික, ශාරීරික, උද්දේශිකය (ii) ශාරීරික, පාරිභෝගික, උද්දේශික ය
(iii) ශාරීරික, උද්දේශික, පාරිභෝගිකය (iv) උද්දේශික. පාරිභෝගික, ශාරීරික ය

(06) සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද රහසින්වත් පව් නොකළ හෙයින්ද සියලු පූජාවන් ලැබීමට සුදුසු වන හෙයින් ද බුදුරජාණන් වහන්සේ

(i) භගවා නම් වන සේක (ii) බුද්ධෝ නම් වන සේක
(iii) සුගතෝ නම් වන සේක (iv) අරහං නම් වන සේක

(07) තෙරුවනෙහි ගුණ

(i) 24 කි (ii) 09 කි (iii) 26 කි (iv) 25 කි

(08) බුද්ධාදී ත්‍රිවිධ රත්නයෙහි ගුණ අවබෝධ කොට ගෙන ඇතිවන ප්‍රසාදය හෙවත් පැහැදීම බුදු දහමේ හැඳින්වෙන්නේ

(i) බුද්ධාලම්බනය නමිනි. (ii) ආකාරවතී සද්ධා නමිනි.

(iii) අමූලිකා සද්ධා නමිනි. (iv) ආගමික භක්තිය නමිනි.

(09) සංඝරත්නයේ ගුණ අතර ආරාධනා කොට වැඩමවා සිව්පසය පුද කිරීමට සුදුසු යන ගුණය ප්‍රකාශ වන්නේ

(i) දක්ඛිණෙය්‍ය යන්නෙනි. (ii) සාමීචිපටිපන්න යන්නෙනි.

(iii) පාහුණෙය්‍ය යන්නෙනි. (iv) ආහුණෙය්‍ය යන්නෙනි.

(10) සමථ භවනාව වැඩීමෙන් ලබාගත හැකි ආනිශංසයක් නොවන්නේ

(i) ධාරණ ශක්තිය වැඩිවේ.

(ii) නිවන් සැප ලබා ගත හැකි වේ.

(iii) කායික රෝග පීඩා අඩු වීමෙන් නිරෝගී වේ.

(iv) සිතෙහි තෘප්තිමත් ස්වභාවයක් ඇති වේ.

(11) පුද්ගල සිතෙහි පවත්නා සියලු කෙළෙසුන් නැති කිරීමෙන් උපදවා ගන්නා ඥානය බුදු දහමේ හඳුන්වන්නේ

(i) මාර්ග ඥානය නමිනි. (ii) ආසවක්ඛය ඥානය නිමිනි.

(iii) දිබ්බසෝත ඥානය නමිනි. (iv) චේතෝපරියාය ඥානය නමිනි.

(12) සිතේ නොසන්සුන් ගතිය මෙන්ම කළ නරක හා නොකළ හොඳ පිළිබඳ පසුතැවිලි වීමේ ගතිය ධර්මයේ හැඳින්වෙන්නේ

(i) විචිකිච්ඡා ලෙසයි. (ii) ව්‍යාපාදය ලෙසයි.

(iii) ථිනමිද්ධ ලෙසයි. (iv) උද්ධච්ච කුක්කුච්ච ලෙසයි.

(13) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් වන්නේ

(i) සාරාර්ථ සංග්‍රහයයි. (ii) ධර්මප්‍රදීපිකාවයි.

(iii) අභිධර්මාර්ථ සංග්‍රහයයි. (iv) බුදුගුණාලංකාරයයි.

(14) දුටුගැමුණු රජතුමා විසින් ඉදි කරන ලද විහාරාරාංග වලට අයත් නොවන්නේ

(i) රුවන්වැලි සෑයයි. (ii) ලෝවාමහාපායයි.

(iii) ථූපාරාමයයි. (iv) මිරිසවැටියයි.

(15) "මා තරුණ වියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත. දැන් මහලු වූයෙමි. ඒ කිසිවක් කරන්නට ශක්තියක් නැත්තේ වෙමි." යන අදහස ගෙන දෙන ගාථාව වන්නේ

(i) උට්ඨානවතො සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ.. යන ගාථාවේය.

(ii) අසාරෙ සාරමතිනො - සාරේචා සාර දස්සිනෝ ... යන ගාථාවේය.

(iii) අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං.... යන ගාථාවේය.

(iv) සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච ... යන ගාථාවේය.

(16) සත්ත්වයාගේ දුක ඇති වීම පටිච්ච සමුප්පාදය සිද්ධාන්තය අනුව විවරණය කෙරේ. එකී පටිච්ච සමුප්පාදයට අයත් අංග සංඛ්‍යාව

(i) 10 කි (ii) 12 කි (iii) 08 කි (iv) 11 කි

(17) සිගාලෝවාද සූත්‍රාගත යුතුකම් හා වගකීම් අනුව පළමුව අවදිවීමත් පසුව නින්දට යාමත්,

(i) දෙමාපියන්ගේ යුතුකමකි. (ii) ශිෂ්‍යයන්ගේ යුතුකමකි.

(iii) ගුරුවරයාගේ යුතුකමකි. (iv) සේවකයාගේ යුතුකමකි.

(18) බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේදී ''පුබ්බදේවා'' නමින් හඳුන්වා ඇත්තේ

(i) පැවිදි උතුමන්ය. (ii) ගුරුවරුන්ය. (iii) දෙමාපියන්ය. (iv) හිත මිතුරන්ය.

(19) ''වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ වසන්නෙමු. අවෛරී ව ජීවත් වන්නෙමු. රාගාදී කෙලෙස් නිසා රෝගී වූ මිනිසුන් අතර අපි කෙලෙස් ලෙඩ නොමැතිව සුවසේ වසන්නෙමු. නිරෝගීව ජීවත් වන්නෙමු. පස්කම් සැප සෙවීමෙහි ම උනන්දු වන්නන් අතර අපි එබඳු උනන්දුවකින් තොරව සුවසේ ජීවත් වන්නෙමු. උත්සුක මිනිසුන් අතර අනුත්සුකව වාසය කරන්නෙමු...'' මෙමගින් අර්ථවත් වන්නේ බුදු දහමේ ඉගැන්වෙන.

(i) පද්මාකාර ජීවිතයයි. (ii) අත්තුපනායික ධර්මපර්යායයි.

(iii) සල්ලේඛ ප්‍රතිපදාවයි. (iv) සහජීවන ප්‍රතිපදාවයි.

(20) නිවන් මග අහුරාලන, සිත සංවර කිරීමට බාධාවන කරුණු පහක් බුදු දහමේ ඉගැන්වෙන්නේ

(i) පංච ස්කන්ධ නමිනි. (ii) පංච නීවරණ නමිනි.

(iii) පංච නියාම ධර්ම නමිනි. (iv) පංච උපාදාන නමිනි.

(21) විපාක දීමට ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව සිව් ආකාර වන කර්ම අතුරෙන් බලවත් චේතනා ශක්තියකින් තොරව සිදු කරන කර්මය හැඳින්වෙන්නේ

(i) කටත්තා කර්ම ලෙසය. (ii) ගරුක කර්ම ලෙසය.

(iii) ආසන්න කර්ම ලෙසය. (iv) ආචිණ්ණ කර්ම ලෙසය.

(22) ''අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ... යනාදී ගාථාව ඇසෙන විට අපට සිහිපත් වන්නේ

(i) වසල සූත්‍රයයි. (ii) පරාභව සූත්‍රයයි.

(iii) මහා පරිනිබ්බාණ සූත්‍රයයි. (iv) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(23) විමුක්තිය සොයා ගිය උපතිස්ස පිරිවැජියාට, දමුණු ඉඳුරන් ඇති, ප්‍රසන්න පෙනුමැති, සන්සුන් ගමනින් වඩින අස්සජි තෙරුන් මුණ ගැසිණි. එහිදී උපතිස්ස පිරිවැජියාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන අස්සජි තෙරහු යම් ධර්මයක් දේශනා කරමින් උපතිස්ස පිරිවැජියාට විමුක්තිය පිණිස මග පෙන්වීය. එහිදී අස්සජි තෙරුන් විසින් දේශනා කරන ලද්දේ

(i) ත්‍රිලක්ෂණය පිළිබඳ ධර්මයයි. (ii) පටිච්චසමුප්පාදය පිළිබඳ ධර්මයකි.

(iii) ත්‍රිවිධ ශික්ෂාව පිළිබඳ ධර්මයකි. (iv) නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිබඳ ධර්මයකි.

(24) ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සසර දුක් හට ගැනීමට හේතු සාකච්ඡා කරනු ලබන්නේ

(i) දෙවැනි ආර්ය සත්‍යය මගිනි. (ii) තෙවැනි ආර්ය සත්‍යය මගගිනි.

(iii) පළමු ආර්ය සත්‍යය මගිනි. (iv) සිව්වැනි ආර්ය්‍යා සත්‍යය මගිනි.

(25) අරමුණු විජානනය හෙවත් අරමුණු දැන ගැනීම සඳහා අප තුළ ඇති ශක්තිය වන්නේ

(i) සංඥාවයි. (ii) වේදනාවයි. (iii) විඥ්ඥාණයයි. (iv) සංස්කාරයි.

(26) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩපයක් බවට පත් කර ගත් අවස්ථාවක් නොවන්නේ

(i) ඉසිපතනයේ මිගදායේ දී පළමු දම් දෙසුම පැවැත්වීමය.

(ii) විශාලා මහනුවර වන පියසකදී මහා සීහනාද සූත්‍රය දේශනා කිරීමය.

(iii) අම්බලට්ඨිකා ආවාසයෙහි දී අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය දේශනා කිරීමය.

(iv) ඇට්ටේරියා වනයකදී සිංසපා සූත්‍රය දේශනා කිරීමය.

(27) මිනිසාගේ අධික තෘෂ්ණාව හේතුවෙන් පරිසර සම්පත් අධි පාරිභෝජනය නිසා ම මිනිසාට මුහුණ දීමට සිදුව ඇති ගැටලුව වන්නේ

(i) මන්දපෝෂණය (ii) ජල දූෂණය (iii) දේශගුණික විපර්යාස (iv) මේ සියල්ල

(28) අපගේ ජීවිතයේ සිදුවන සියල්ල හෝ අප කරන සියල්ල හෝ අතීත කර්ම හේතුවෙන් ම සිදුවේය යන අදහස බුද්ධ ධර්මය සමග

(i) පිළිගත හැකිය (ii) ගැළපේ (iii) විවාදාපන්නයි (iv) නොගැළපේ

(29) පව් කිරීමට ඇති වන ලැජ්ජාව සහ පව් කිරීමට ඇති බිය යන කාරණා ධර්මයෙහි විස්තර වන්නේ

(i) ලෝකෝත්තර ධර්ම නිමිනි. (ii) ලෝකායත ධර්ම නමිනි.

(iii) ලෝකපාලක ධර්ම නිමිනි. (iv) අෂ්ට ලෝක ධර්ම නිමිනි.

(30) මෙලොව ජීවිතයේ දී ගරු කළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන් නොපුදන අධික මානයෙන් යුත් තැනැත්තා ඊළඟ භවයේ දී මිනිස් ලොව උපන්නොත්,

(i) උසස් යැයි සම්මත කුලවල උපදී (ii) පහත් යැයි සම්මත කුලවල උපදී.

(iii) ප්‍රඥාවෙන් අඩුව උපදී. (iv) ප්‍රඥාවන්ත වී උපදී.

(31) ක්‍රි.පූ. පළමු සියවසේ මාතලේ අලුවිහාරයේදී පවත්වන ලද සිව්වන ධර්ම සංගීතිය සඳහා අනුග්‍රාහකත්වය ලබාදුන්නේ

(i) වළගම්බා රජුය. (ii) වෙළඳ නායකයෙකි.

(iii) උත්තිය රජුය. (iv) ප්‍රාදේශීය නායකයෙකි.

(32) බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය මෙන්ම නිර්මාණාත්මක සෞන්දර්ය ද අගය කොට ඇති අවස්ථා පෙළ දහමෙන් හමුවේ. මෙකී උභය සෞන්දර්ය අතර නිර්මාණාත්මක සෞන්දර්ය උත්පාදනය කරන මාධ්‍යයක් ලෙස සැලකිය හැක්කේ

(i) මහවනය (ii) ගංගා, ඇළ, දොළය (iii) බෞද්ධ ස්තූපය (iv) වන සතුන්ය

(33) පාසලෙන් සංවිධානය කරන ලද අනුරාධපුර අධ්‍යාපන චාරිකාව නිම කළ ගුරුතුමා සිංහල කැටයම් ශිල්පියාගේ විශිෂ්ට කලා කුසලතාව පෙන්නුම් කරන නිර්මාණයකට නිදසුනක් දක්වන ලෙස දන්වීය. ඔවුන් විසින් පෙන්වා දෙන ලද නිවැරදි නිදසුන වන්නේ

(i) ථූපාරාමය වටා ඇති ගල් කණු පෙළ යන්නයි.

(ii) ස්තූපය වට කොට සැදූ වටදාගෙය යන්නයි.

(iii) අනුරාධපුරයේ පිහිටි කුට්ටම් පොකුණ යන්නයි.

(iv) අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල ඇති සඳකඩ පහණ යන්නයි.

(34) ලක්දිව හිටි පිළිමවල ප්‍රකටව දක්නට ලැබෙන මුද්‍රා ක්‍රමය වන්නේ,

(i) විතර්ක මුද්‍රාවයි. (ii) ධර්මචක්‍ර මුද්‍රාවයි

(iii) වරද මුද්‍රාවයි. (iv) අසාන මුද්‍රාවයි

(35) පොළොන්නරු යුගයේ ගුරුළුගෝමී පඬිතුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් වන්නේ,

(i) ධර්ම ප්‍රදීපිකාව හා සද්ධර්මාලංකාරයයි.

(ii) අමාවතුර හා සද්ධර්ම රත්නාවලියයි.

(iii) දම්පිය අටුවා ගැටපදය හා සිඛවළඳ විනිසයි.

(iv) ධර්මප්‍රදීපිකාව හා අමාවතුරයි.

(36) "ආකාරවතී" යන පාරිභාෂික වචනය

(i) දෘඪිව ග්‍රහණය කිරීම පැහැදිලි කිරීමට භාවිතා කරයි.

(ii) නිරවද්‍යතාව පැහැදිලි කිරීමට භාවිත කරයි.

(iii) ඉල්පෙන ශ්‍රද්ධාව පැහැදිලි කිරීමට භාවිත කරයි.

(iv) අවබෝධයෙන් යුතු පැහැදීම ගෙන හැර දක්වීමට භාවිත කරයි.

# කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය

## දෙවන වාර පරීක්ෂණය - 2017

## බුද්ධ ධර්මය

**11 ශ්‍රේණිය** **II පත්‍රය** **කාලය: පැය 02 යි**

- පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) "මිනිස්සු රාගයෙන් රාගයට ම යති, ද්වේශයෙන් ද්වේශයටම යති. මෝහයෙන් මෝහයටම යති." ධර්මයෙහි මෙය හැඳින්වෙන්නේ කුමන නමකින්ද ?
(ii) "'සමග්ගා හෝථ මා විවාදා" යන්නෙහි අර්ථය ලියන්න.
(iii) කුසල මූල දෙකක් ලියන්න.
(iv) සමථ භාවනාව සඳහා යෙදෙන වෙනත් නම් දෙකක් ලියන්න.
(v) ඉන්දියාවේ කණිෂ්ක රජතුමා පැවැත්වූ ධර්ම සංගායනාව වන්නේ හතරවන ධර්ම සංගායනාවයි. මෙය හැඳින්වෙන වෙනත් නමක් ලියන්න.
(vi) ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. එයින් දෙකක් නම් කරන්න.
(vii) "අඩ්ඪචන්ද්‍රපාෂාණ" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?
(viii) වණ්ණුපථ ජාතකයෙන් හෙළිවන්නේ කවර පාරමිතාවක්ද ?
(ix) බෞද්ධයාගේ අත්පොත වන්නේ ධම්මපදයයි. එය අයත් වන පිටකය නම් කරන්න.
(x) හේතුවක් මුල් කරක ගෙන ඵලයක් ඇති වන ආකාරයත්, හේතුව නැති වීමෙන් ඵලය නැතිවන ආකාරයත් ඇතුළත් න්‍යාය ලියන්න. (ලකුණු 20)

(02) (i) "සමාදාන" හා විරමණ යන වචනවල අර්ථය ලියන්න. (ලකුණු 02)
(ii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එයින් තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) සිල්වත් වීමෙන් පුද්ගල සංවර්ධනය හා සමාජ සංවර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාරය. එයින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඔබ නම් කළ එක් කර්ම ප්‍රභේදයක් ගැන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(iii) අකුසලයෙන් දුරු වී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) "සතර සංග්‍රහ වස්තුව" බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තියකි. එහි ඇතුළත් කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඔබ නම් කළ එක් කරුණක් පිළිබඳව පැහැදිලි කරරන්න. (ලකුණු 03)
(iii) සමාජයේ සියලු දෙනාගේම යහපත හා අභිවෘද්ධිය සඳහා සතරසංග්‍රහ වස්තුව අදාළ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) තාදි ගුණය යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 02)
(ii) බුදු ගුණ අතරින් තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iii) බුදුරජාණන් වහන්සේ අසරණ සරණ වූ සේක. නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) "තංච කම්මං කතං සාධු..." යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
(ii) එම ගාථාවෙහි අර්ථය ලියන්න. (ලකුණු 03)
(iii) සුදුසු කාලයේදී නිවැරදිව අප්‍රමාදීව කටයුතු කිරීමෙන් පුද්ගල ජීවිත සතුටට පත් වේ. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i) ධම්ම පදය
(ii) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා
(iii) පංච නීවරණ ධර්ම
(iv) ප්‍රථම ධර්මසංගායනාව (ලකුණු 5 x 2=10)

(37) "සැබෑ බෞද්ධයා, මිනිසෙකුට තබා කුහුඹුවෙකුටවත් හිංසා පීඩා නොකරන අතර, කිසිදු හේතුවක් නිසා අන්සතු වස්තුව පිළිබඳව ලෝභ සිතිවිල්ලක් පවා උපදවා නොගනියි. රටේ නීතියට මෙන්ම සමාජ සදාචාරයට ද ගරු කරන ඔහු සාදාචාරමය සීමාව තුළ කාමභෝගී වූත්, තෘප්තිමත් වූත් නිරවුල් විවාහ දිවියක සුව විඳියි. පවුලේ මෙන් ම සමාජයේ සාමය හා සහජීවනය අගය කරන හෙතෙම සියලු දෙනාගේ විශ්වාසය දිනා සත්‍යවාදීව ජීවත්වෙයි. ඔහු කාමභෝගී කටයුතු කළ ද කාමයෙන් හෝ සුරාවෙන් හෝ අන්කිසිවකින් 'මුසපත්ව අගතිගාමීව කටයුතු නොකරයි.'' මේ අනුව පැහැදිලි වන්නේ සැබෑ බෞද්ධයා,

(i) කාමයෙන් මුසපත් ව කටයුතු නොකරන බවයි.

(ii) රටේ නීතියට හා සමාජ සදාචාරයට ගරු කරමින් ජීවත් වන බවයි.

(iii) සාර්ථක විවාහ දිවියක් ගත කරන බවයි.

(iv) පන්සිල් සුරකින බවයි.

(38) සූත්‍ර දේශනා තුළ පුද්ගලයාගේ මෙලොව දියුණුවට අදාළ ධර්ම කරුණු රාශියක් විග්‍රහ වී තිබේ. එකී සූත්‍ර දේශනාවන් අතර සුවිශේෂී සූත්‍ර දේශනාවන් වන්නේ

(i) ගිරිමානන්ද, මෙත්තානි සංස, වසල යන සූත්‍ර දේශනාවන්ය.

(ii) ධම්මික, අනණ,, කරණීයමෙත්ත යන සූත්‍ර දේශනාවන්ය.

(iii) සිගාලෝවාද, මහා මංගල, පරාභව යන සූත්‍ර දේශනාවන්ය.

(iv) ව්‍යග්ඝපජ්ජ, කසීබාරද්වාජ, පහාරාද යන සූත්‍ර දේශනාවන්ය.

(39) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට තෝරාගත් නගරය වූයේ

(i) සැවැත් නුවර ය. (ii) රජගහනුවරය.

(iii) කුසිනාරා නුවරය. (iv) විශාලාමහනුවරය.

(40) සීල, සමාධි, ප්‍රඥා යනුවෙන් ධර්මයෙහි විස්තර වන්නේ

(i) තිදොර යි. (ii) ත්‍රිලක්ෂණයයි. (iii) ත්‍රිශික්ෂාවයි. (iv) ත්‍රිවේදයයි.